**රාජ්‍ය අංශයේ ගණකාධිකාරීවරුන්ගේ, විගණකවරුන්ගේ සහ තක්සේරුකරුවන්ගේ වෘත්තීය කුසලතා සහ නිපුණතා වර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ “රාජ්‍ය අංශය” ලෙස ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීන්ගේ සංගමය බිහිවේ.**

රාජ්‍ය අංශයේ ගණකාධිකාරීවරුන්ගේ, විගණකවරුන්ගේ සහ තක්සේරුකරුවන්ගෙ වෘත්තීය නිපුනතා සහ කුසලතා වර්ධනය සඳහා, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් කෙරෙන අඛණ්ඩ උත්සාහයේදී, රාජ්‍ය අංශයේ ගණකාධිකාරීවරුන්, විගණකවරුන සහ තක්සේරුකරුවන් දිරිමත් කිරීමටත් ඔවුන්ගේ වෘත්තියමය තත්වය ඉහල තලයකට ගෙන ඒම සඳහාත්, මූලාරම්භයන් ගනනාවක් හඳුන්වා දෙන ලදි.

ජාතියේ ප්‍රමුඛතම වෘත්තීය ගණකාධිකාරී ආයතනය ලෙස මෙන්ම සාමාජිකයින්ගේ වෘත්තීය තත්වයන් දේශීය මෙන්ම විදේශීයවද ඉතා ඉහල මට්ටමක පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය ගන්නා පියවර අතර රාජ්‍ය අංශයේ ගණකාධිකාරීවරුන්ගේ, විගණකවරුන්ගේ සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තක්සේරුකරුවන්ගේ සුභ සිද්ධිය උදෙසා සැළකිය යුතු පියවර කිහිපයක් ගෙන ඇත.

මෙම පියවරයන් අතර, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශයේ සාමාජිකයින් ඇතුලත් රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත කමිටුවක් ස්ථාපිත කිරීම සුවිශේෂ වේ. මෙම කමිටුව මගින් දැනට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශය හා ඒකාබද්ධව ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත හතරක් ප්‍රකාශයට පත්කර ඇති අතර තවත් ප්‍රමිත හයක් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු සම්පාදනය කරමින් සිටී.

මෙම රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කිරීම තුලින් මූල්‍ය වාර්තාකරණයේ ගුණාත්මක භාවය ඉහල නැංවීමට රාජ්‍ය අංශයේ ගණකාධිකාරීවරුන්ට සහ විගණකවරුන්ට අවශ්‍ය සේවා ලබා දීම පිණිස රාජ්‍ය අංශයේ ගිණුම්කරණ පීඨයක් ස්ථාපනය කරන ලදි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාපති සුජීව රාජපක්ෂ මහතා අවධාරණය කර සිටියේ ප්‍රමුඛතම රාජ්‍ය නිළධාරීන් වන විගණකාධිපති, රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජෙනරාල් සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජෙනරාල් වැන්නන්, රාජ්‍ය අංශයේ ගණකාධිකාරීවරුන්ගේ, විගණකවරුන්ගේ සහ තක්සේරුකරුවන්ගේ කුසලතා සහ නිපුණතාවයන් වර්ධනය කිරීමේ වරලත් ගණකාධිකාරී ආයතනයේ මෙම මූලාරම්භයන් වෙනුවෙන් ඉතා වැදගත් දායකත්වයක් ලබා දෙන බවය.

මෙම සාධනීය වර්ධනයන් සැළකිල්ලට ගෙන, රාජ්‍ය අංශයේ ගණකාධිකාරීවරුන්ගේ හා විගණකයින්ගේ වෘත්තීය ආයතනය වන ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය සහ සංවර්ධන ගණකාධිකරණ ආයතනය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සමග එක්ව, ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීන්ගේ සංගමය (APFASL) පිහිටුවා ගන්නා ලදි.

මෙම ප්‍රකාශය සනාථ කරමින් රාජපක්ෂ මහතා දක්වා සිටියේ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් එහි රාජ්‍ය අංශය ලෙස ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීන්ගේ සංගමය (APFASL), මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යංශයේ මූල්‍ය අධ්‍යයන ආයතනයෙ ජ්‍යේෂ්ඨ මූල්‍ය උපදේශක වී කණගසභාපති, වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාපති සහ උප සභාපති සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ, ගිණුම්කරණ හා විගණන සේවයේ ජ්‍යෙෂ්ඨ සමාජිකයින් වන විගණකාධිපති, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජෙනරාල්, රාජ්‍ය ගිණම් අංශයේ අධ්‍යක්ෂ ජෙනරාල් වැනි ප්‍රකට කළමනාකරණ මණ්ඩලයකින් යුක්තව ස්ථාපනය කිරීමට මූලිකත්වය ගන්නා ලද්දේ රාජ්‍ය අංශයේ ගණකාධිකාරීවරුන්ගේ, විගණකවරුන්ගේ සහ තක්සේරුකරුවන්ගේ වෘත්තීය කුසලතා සහ නිපුණතාවයන් වර්ධනය කිරීමේ අරමුණින් බවය.

හැකියා වර්ධනය තුලින්, රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මෑතකදී ශ්‍රී ලංකා රජය සහ ලෝක බැංකුව සමග ගිවිසුමකට අත්සන් තබන ලදි. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා එංගලන්තයේ වරලත් රාජ්‍ය මූල්‍ය සහ ගිණුම්කරණ ආයතනයේද සහාය ඇතිව රාජ්‍ය අංශයේ ගණකාධිකාරීවරුන්, විගණකවරුන් සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තක්සේරුකරුවන් පුහුණු කිරීම සඳහා අවශ්‍ය පුහුණු පාඨමාලා සහ පුහුණු අත්පොත් සම්පාදනය කිරීමට පියවර ගනු ලැබේ.

රාජ්‍ය අංශයේ ගණකාධිකාරීවරුන්ගේ, විගණකවරුන්ගේ සහ තක්සේරුකරුවන්ගේ වෘත්තීය තත්වයේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීමට සහ ඉහල නැංවීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, එංගලන්තයේ වරලත් රාජ්‍ය මූල්‍ය සහ ගිණුම්කරණ ආයතනය (CIPFA) සමග ඒකාබද්ධව වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී(CPFA) සුදුසුකම පිරි නැමීමට අවශ්‍ය කරන වෘත්තීය මට්ටමේ විභාග පැවැත්වීමට අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදි. තවද රාජ්‍ය අංශයේ ගණකාධිකාරීවරුන්ට, විගණකවරුන්ට සහ තක්සේරුකරුවන්ට එංගලන්තයේ වරලත් රාජ්‍ය මූල්‍ය සහ ගිණුම්කරණ ආයතනයේ වෘත්තීය මට්ටමේ විභාග කළ හැකිවන පරිදි අන්තර් මධ්‍ය සුදුසුකමක් ලබා දීමට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් අනුමැතිය දී ඇත.

රාජපක්ෂ මහතා පෙන්වා දෙනු ලැබුවේ රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය තුල සංවර්ධනය සඳහා සැලකිය යුතු ඉඩ කඩක් පවතින බවත්, කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් සඳහා වර්තමානයේ රාජ්‍ය අංශය තුල වෘත්තීය හැකියාවන් සහ කුසලතාවයන්ගේ වැඩිදියුණුවක් අවශ්‍ය වන 1400 කට ආසන්න ගණකාධිකාරීන් පිරිසක් සහ 200 කට ආසන්න විගණකවරුන් පිරිසක් ඇති බවය.

රාජ්‍ය සේවය පිළිබඳව පොදු මහජනතාවගේ මතය වනුයේ ජාත්‍යන්තරව පිළිගත් උසස්ම පරිචයන් අනුගමනය කිරීමට, රාජ්‍ය සේවයෙ වෘත්තීය කුසලතා සහ විශේෂඥතාවයෙහි සංවර්ධනයක් අත්‍යවශ්‍ය බවය. එබැවින් රාජ්‍ය අංශය තුල මූල්‍ය කළමනාකරණ හැකියා අවශ්‍යයෙන්ම සංවර්ධනය කල යුතු බව රාජපක්ෂ මහතා පෙන්වා දුන්නේය.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ගනු ලැබූ වැදගත් පියවරයන් ගැන අවධාරණය කරමින් රාජපක්ෂ මහතා රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරුවන් හට ආරාධනා කර සිටියේ වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පිරිනමනු ලබන වැඩසටහන් මනා සේ උපයෝගී කර ගනිමින් ඔවුන්ගේ වෘත්තීය කුසලතා වැඩි දියුනු කරගන්නා ලෙසත් එමගින් රාජ්‍ය අංශයේ කාර්‍යක්ෂම මූල්‍ය කළමනාකරණය තුලින් ඔවුන්ගේ සේවා වල කාර්‍යක්ෂමතාව සහ ඵලදායීතාව ප්‍රවර්ධනය කරගන්නා ලෙසත්ය.

ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීන්ගේ සංගමයේ සභාපති, කණගසභාපති මහතාගේ විශ්වාසය වනුයේ මෙම සංගමය මගින් රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණ වෘත්තිකයින් ගේ වෘත්තීය හැකියාවන් සහ විශේෂඥතාවය වැඩි දියුනු කර ගැනීමට මග පෑදෙන බවත්, ජාත්‍යන්තරව පිළිගත් උසස්ම පරිචයන් භාවිතයෙන් රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය වෘත්තීය මට්ටමට පැමිණෙන බවත්ය.

වැඩි දුරටත් ඔහු පෙන්වා දුන්නේ මේ වන විටත් සංගමයේ සාමාජිකත්වය ලබා ගැනීමට අයදුම් පත් 500 කට අධික සංඛ්‍යාවක් ලැබී ඇති හෙයින්, අනෙකුත් අයටද අවධාරණය කරන ලද්දේ මෙම ස්වර්ණමය අවස්ථාව මග නොහැර රාජ්‍ය අංශයේ ගණකාධිකාරීවරුන්, විගණකවරුන් සහ තක්සේරුකරුවන් අතර අත්වැල් බැඳ ගනිමින් ආයතන හැකියාවන් ගොඩනගා ගන්නා ලෙසය.